# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1716/23 - 2011 ජූලි 27 වැනි බදාදා - 2011.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 5/83.

**1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත**

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද යාපා අබේවර්ධන,
කෘෂිකර්ම අමාත්‍ය.

2011 ජූලි මස 22 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2000 ජනවාරි 05 දිනැති අංක 1113/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද, 1999 අංක 1 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ (විකිණීමේ සහ සැපයීමේ) නියෝගවල සඳහන් 2 වැනි නියෝගය පහත සඳහන් ලෙස සංශෝධනය කරනු ලැබේ :-

"2. (1) කිසිම තැනැත්තකු විසින්, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා වෙත කෘෂි රසායන අලෙවි හා තාක්ෂණ සහායකවරයෙකු වශයෙන් නිසි පරිදි ලියාපදිංචි වී ඇති තැනැත්තෙකු හෝ එවැනි තැනැත්තෙකු සේවයේ යොදවා ඇත්නම් මිස, සාමාන්‍ය හෝ සීමා කරන ලද පළිබෝධනාශකයක් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් කෘෂි රසායන අලෙවි හා තාක්ෂණ සහායකවරයෙකු පුහුණු කිරීම සඳහා තෝරා ගැනීමේ දී අදාළ වන නිර්ණායක හා ගාස්තු කමිටුව විමසා පිළියෙල කරනු ලැබිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් තැනැත්තෙකු කෘෂි රසායන භාවිතය සහ ඒ හා සම්බන්ධ ආනුෂාංගික කාරණා පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවේ 4 වන මට්ටම හෝ ඊට සමාන පුහුණුවක් සපුරා ඇත්නම් සහ අයදුම්පත සමග පුහුණු සහතික ඉදිරිපත් කිරීමෙන් පසු කෘෂි රසායන අලෙවි හා තාක්ෂණ සහායකවරයෙකු ලෙස ලියාපදිංචි කළ යුතු ය.

(4) ඉහත (3) ජේදයේ සඳහන් සෑම ලියාපදිංචි කිරීමක් ම අවුරුදු තුනක කාලයකට වලංගු වන අතර නැවත ලියාපදිංචි කිරීමකට යටත් විය යුතු ය.

1A - G 14847— 930 (2011/07)

(5) නැවත ලියාපදිංචි කිරීමක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම-

(අ) නියෝග මගින් දක්වා ඇති තාක්ෂණික නිපුනතා සපුරා ඇති බවට සනාථ කරන ලියවිලි ;
(ආ) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයෙකු විසින් සිදු කරන ලද ශාරීරික යෝග්‍යතාව පිළිබඳ පූර්ණ වාර්තාවක් ; සහ
(ඇ) අදාළ ගාස්තු

ඉදිරිපත් කළ යුතු ය.

(6) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අදහස් වන්නේ නම් මිස -

"කමිටුව" යන්නෙන් 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පිහිටුවන ලද පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුව අදහස් වේ.

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පත් කරන ලද රෙජිස්ට්‍රාර්වරයකු අදහස් වේ.".

08-325

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.